# යටියන්තොට ප්‍රාදේශීය සභාව

# ප්‍රසම්පාදන දැන්වීමයි.

පහත සඳහන් වැඩ විෂයන් සඳහා යටියන්තොට ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටු සභාපති වන මා විසින් සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍ර තබන මිල ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | වැඩ විෂය | ලියාපදිංචි ශ්‍රේණිය | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු (රු) | ආපසු ගෙවන ලංසු බැඳුම්කර ගාස්තු (රු) | කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තු ගත වැඩ වටිනාකම (රු) |
|---|---|---|---|---|---|
| 01 | කලටුවාව කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීම | C9 හෝ ඊට වැඩි | 1000.00 | 30,000.00 | 2,910,000.00 |
| 02 | යටියන්තොට පොදු වෙළඳපල වහලය අළුත්වැඩියා කිරීම | C9 හෝ ඊට වැඩි | 1000.00 | 26,000.00 | 2,588,784.04 |

02.මෙම ලංසු කැඳවීම ප්‍රාදේශීය තරගකාරී ක්‍රියාපටිපාටිය යටතේ සිදු කරනු ලබන අතර මෙම කර්මාන්තයට අදාල CIDA ශ්‍රේණිගත ප්‍රමුඛතාවය හෝ සබරගමු පළාත් ඉදි කිරීම් කොන්ත්‍රාත් ලියාපදිංචිය පදනම් කර ගනිමින් ලංසුකරුවන් තෝරා ගැනීම සිදු කරනු ලබයි.

03.2025.09.22 දින සිට 2025.10.07 දින පෙ.ව 8.30 - ප.ව 03.00 දක්වා සතියේ වැඩ කරන දිනයන්හිදී රු.1000.00 ක ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු මුදලක් හා ආපසු ගෙවනු ලබන ලංසු බැඳුම් කරයේ වටිනාකම ලෙස මුදලින් තැන්පත් කිරීමෙන් අනතුරුව ලබා දෙන රිසිට් පත ඉදිරිපත් කිරීමෙන් පසු යටියන්තොට ප්‍රාදේශීය සභා කාර්යාලයෙන් ලංසු ලේඛන ලබා ගත හැක.

04.නිවැරදිව සම්පූර්ණ කරන ලද සියලුම ලංසු මුල් ලංසුපත හා පිටපත යනුවෙන් සඳහන් කර වෙන වෙනම කවර දෙකක බහා වෙන් වෙන්ව මුද්‍රා තබා නැවත එක් කවරයක බහා මුද්‍රා තබා ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.එසේ වුවද මුද්‍රා තබන ලද ලංසුව ලංසුකරු හෝ ඔහුගේ නියෝජිතයා විසින් යටියන්තොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ පිහිටි ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම කල හැක.

05.ලංසු බහාලන මුද්‍රා තබන ලද කවරයේ වම් පස උඩ කෙලවරෙහි කර්මාන්තයේ නම සඳහන් කල යුතු අතර එය 2025.10.08 වන දින පෙ.ව 11.00ට පෙර ලැබෙන සේ යටියන්තොට ප්‍රාදේශීය සභාව වෙත එවිය යුතුය.

06.ලංසු සඳහා ඉල්ලුම්කල යුත්තේ 2025.09.22 දින සිට 2025.10.07 දින පෙ.ව 8.30 - ප.ව 03.00 දක්වා කාලය තුල නිකුත් කරනු ලබන ලංසු ආකෘති පත්‍ර මඟින් පමණි.

07.2025.10.08 දින පෙ.ව 11.00 දක්වා ලංසු භාරගන්නා අතර ලංසු විවෘත කිරීම එදිනම පෙ.ව 11.30ට යටියන්තොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ප්‍රසම්පාදන කමිටුව මඟින් සිදු කරනු ලබයි.

08.පිළිගත් ආකෘති පත්‍රය මඟින් ඉදිරිපත් කරනු නොලබන හෝ මෙහි සඳහන් කර දක්වා ඇති කොන්දේසි හා අවශ්‍යතාවයන්ට තරයේ අනුකූල නොවන කිසිදු ලංසුවක් සලකා බලනු නොලැබේ.

09.අදාල වේලාවෙන් පසුව ලැබෙන ලංසුවක් ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඕනෑම ලංසුවක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය යටියන්තොට ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුව සතුය.

10.ලංසු පත් විවෘත කිරීමේ අවස්ථාවට ඉල්ලුම්කරුවන් හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයන් හට සම්බන්ධ විය හැක.

11.ලංසුව පිළිගත් බවට දැනුම් දුන් පසු තමා විසින් ඇතුළත් විය යුතු ගිවිසුම් පිළිබඳ විස්තරය සඳහන් කොන්ත්‍රාත් ගිවිසුම ලංසුකරුවන් විසින් හොඳින් අධ්‍යනය කර ගිවිසුම් ගත වීමෙන් පසු අදාළ කාලය තුල දී කොන්ත්‍රාත්තුව නිම කල යුතුය.

12.මෙම කර්මාන්ත පිළිබඳ සියලු විස්තර යටියන්තොට ප්‍රාදේශීය සභාව වෙත පැමිණ හෝ දුරකතන අංක 071 8067971 / 075 776 9683 වෙතින් කාර්මික නිලධාරි විමසා ලබා ගත හැක.

ඩී.කේ.ටී.ඩී දෙවනගුරු
ප්‍රසම්පාදන කමිටු සභාපති
සභාපති
යටියන්තොට ප්‍රාදේශීය සභාව